මොරටුව මහානගර සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව මහානගර සභාවේ2024දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024දෙසැම්බර් 31 දිනට මොරටුව මහානගර සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වනබැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නාලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් පාලන ආයතන සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2.1 යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීම, වත්කම් ක්ෂය කිරීම් සහ වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්වලින් ආදායමට හඳුනා ගැනීම ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණි.	ඉදිරියේදීඑම ප්‍රත්‍යාගණන වත්කම් ගිණුම් ගත කිරීමටත්, ක්ෂය කිරීම් ගිණුම් ගත කිරීමටත්, ගොඩනැගිලි හා වාහන ද නිවැරදිවහඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව.	ප්‍රමිතියප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල රු.2,454,550ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට සටහන් කරගත් බව.	ප්‍රමිතියප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පිරිවැය රු. 4,305,365 ක් වූ වාහන 3 ක් සහ ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් වී නොතිබූ ගල්රෝලක් ප්‍රවර්ථන වර්ෂයේ අපහරණය කර ඇතත් ඒ සඳහා ගැලපීම් සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අපහරණය කළ වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ගිණුම් විෂයයන් 02ක මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂය රු. 66,035,106 ක් වුවද, ඊට අදාල උපලේඛන අනුව ශේෂය රු.62,588,162ක් වූයෙන් රු.3,446,944ක නොසැසඳුනු වෙනසක් විය.	2021 වර්ෂයේ සේවක ණය පාලන ගිණුමේ නොසැසඳුනු රු.3,143,089කවෙනස නිශ්චිතව පවත්වා ගනිමින් ඉදිරියට උපලේඛන අනුව සැසඳෙන අයුරින් ගිණුම නිවැරදිව පවත්වාගෙන යනු ලබන බවත් මධ්‍යම වෙළඳපල කඩ කුලී ගිණුම තුලනය කිරීම සඳහා කපා හැරීම් ශේෂයක් ලෙස එකතු කර ඇති බව.	වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
යාවත්කාලීන කරන ලද වත්කම් ලේඛණ, කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛණ, ශේෂ සනාථ කිරීම් සහ භෞතික තොග විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.91,528,136 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය හා සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	ශේෂ 04ක් නිරවුල් කරමින් පවතින බවත්, ශේෂ 02 ක් කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, ශේෂ 02ක උපලේඛන සොයාගත නොහැකි බව.	විගණනයට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7..1 නීතිරීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීතිරීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති ,රෙගුලාසි ආදීයට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි			
(i) මු.රෙ. 104 (4)	සභාව සතු වාහන 07 ක අනතුරු සිදු වි මාස 03 ක් ගතවිමට ප්‍රථම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මුදල් රෙගුලාසියප්‍ර කාරව කටයුතු කළ යුතුය.

(ii) මු.රෙ. 156	2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,200 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර එම මුදල්වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මුදල් රෙගුලාසියප්‍ර කාරව කටයුතු කළ යුතුය.
(iii) මු.රෙ.156	සභාවට එරෙහිව පවරන ලද නඩුවක් සඳහා 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු.11,602,318ක් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මුදල් රෙගුලාසියප්‍ර කාරව කටයුතු කළ යුතුය.
(iv) මු.රෙ. 486 (i)	1998 සිට 2003 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් වටිනාකම රු.491,288ක් වූ අගරු චෙක්පත් 86කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදීදඅයකරගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මුදල් රෙගුලාසියප්‍ර කාරව කටයුතු කළ යුතුය.
(v) මු.රෙ. 1653	වාහන 35 ක මයිලෝ මීටරය අක්‍රියව පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)2017 නොවැම්බර් 07දිනැති අංක22/99 (xxxiii) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා බස්නාහිරපළාත් ආණ්ඩුකාර ලේකම්ගේ2018 ජනවාරි 12 දිනැති අංක GOS/ADM/02/19/02/2018 දරණ ලිපිය	පරිපාලන නිලධාරින්ට ප්‍රවාහන කටයුතු සඳහා වෙනම ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	චක්‍රලේඛය හා ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)2009අප්‍රේල්16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ(iv)ජේදය	සභාවේ සැලසුම් කමිටු රැස්වීම සඳහා පැමිණිම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කර ගැනීමකින් තොරව පැමිණීමේ ලේඛනය පමණක්	පිළිතුරු ලබා දී නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	පදනම් කරගෙන දීමනා ගෙවා තිබුණි. 2024 අප්‍රේල් සිට අගෝස්තු මාසය දක්වා කමිටුවට සහභාගී වූ නිලධාරින් 05 දෙනකු සඳහා ඇඟිලි සලකුණු සටහන් නොතිබූ අවස්ථා 50 ක් වෙනුවෙන් රු.125,000 ක් දීමනා ගෙවා තිබුණි.	

1.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මහා නගර සහා ආඥා පනත (252)අධිකාරය188(1)උපවගන්තියට අනුව මහා නගර සභා අරමුදලින් ගෙවීම් කළ නොහැකි සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා 2015හා 2016 වර්ෂයේදි සභා අරමුදලින් පිළිවෙලින් රු.953,715ක් හා රු.1,086,807ක් වශයෙන් එකතුව රු.2,040,522 ක්ගෙවා තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර ද නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සභාවට අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) අංක 05/2013 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් මෙතෙක් රියදුරන්ට සහ කාර්යාල සේවක සේවයේ නිලධාරින්ට ලබා දුන් නිල ඇඳුම් සහ මැහුම් කුලී වෙනුවට 2013 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වාර්ෂිකව රු.4000 ක දීමනාවක් ගෙවිය යුතු බව දක්වා තිබුණද එම චක්‍රලේඛයට පටහැනිව 2022 සැප්තැම්බර් 01 දින පැවති මාසික සභා රැස්වීමේදී ආයතන කාර්යය මණ්ඩලය වෙත නිල ඇඳුම් නිකුත් කිරීම සඳහා රු.5000 ක මුදලක් ලබා දීමට තීරණය කර 2022 වර්ෂයේදී රු.3,515,000 ක් හා 2023 වර්ෂයේදී රු.3,390,000 ක් ගෙවා තිබුණි.	පිළිතුරු ලබා දි නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.182,652,319ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.67,100,827ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම (රු.'000)	බිල්කළ ආදායම (රු.'000)	රැස්කළ ආදායම (රු.'000)	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.'000)	ඇස්තමේන්තු ගත ආදායම (රු.'000)	බිල්කළ ආදායම (රු.'000)	රැස්කළ ආදායම (රු.'000)	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.'000)
වරිපනම් හා බදු	214,000	214,534	231,225	290,731	213,520	211,281	142,595	300,320
කුලී	18,228	16,032	12,742	3,289	10,090	13,969	11,958	2,011
බලපත්‍ර ගාස්:	9,000	7,518	7,502	16	9,000	6,861	6,790	71
වෙනත් ආදායම්	1,500	-	8,041	-	1,500	6,087	6,087	-
එකතුව	242,728	238,084	259,510	294,036	234,110	238,198	167,430	302,402

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	වරිපනම් හා බදු		
(අ)	මහා නගර සභා ආඥාපනතේ 252(1)(අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2024 දෙසැම්බර් 31දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.290,730,807ක් වූ අතර ඒ තුළ හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 318 කින් අයවිය යුතු රු.87,909,603ක් විය.	වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 33 හිඟ මුදල හා ඒකක 64 හිඟ මුදලින් කොටසක්ද සම්පූර්ණ වටිනාකම රු.15,612,833ක හිඟ එකතු වි ඇති බව .	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 ජනවාරි 01 වන දිනට රු.300,320,232ක හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් රු.81,186,072 ක් හෙවත් සියයට 27ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණද, රු.219,134,160 ක් හෙවත් සියයට 73 ක් අයකර ගැනිමට සභාව අපොහොසත් වි තිබුණි.	ආදායම් පරීක්ෂකවරුන් හා දේපළ තහනම් කිරීමේ නිලධාරින් මගින් වරිපනම් බදු එකතු කිරීම මෙන්ම ජංගම සේවා මගින් වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය ආයතන 245කින් 2024දෙසැම්බර් 31දිනට වරිපනම් ලෙස රු.44,636,263 ක්	තව දුරටත් පවතින හිඟ වරිපනම් මුදල්අයකර ගැනීමට සිහි කැඳවීම්	හිඟ ආදායම් කඩිනමින් අයකර

	ලැබිය යුතු අතර රු.1,000,000ක් ඉක්මවූ හිඟ වරිපනම් සහිත රාජ්‍ය ආයතන 10කින් ලැබිය යුතු මුදල රු.40,479,202ක් විය.	ලිපි යොමු කර ඇති බව.	ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 ජනවාරි 01දිනට ලැබිය යුතු රු.62,604,717ක කසල බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,817,140ක් පමණක් අයකරගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයේ සැහැල්ලු කසල ඉවත් කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.68,688,457ක කසල බදු ආදායම තුළ ඇතුළත් වර්ෂ 10කට වඩා පැරණිරු.7,819,040 ක් අයකර ගැනීමට සභාව විසින් සාධනීය පියවරයන් ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2.2.3 කුලී

(අ)	මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 254 (අ) 1 සහ 2 වන වගන්ති අනුව දීර්ඝ කාලීන බදු දෙන දේපළ 145කින් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.6,854,837ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු බදු දෙන දේපළ 282ක් අතරින් 22ක් බදු දීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	දේපළ කඩිනමින් බදු දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දීර්ඝ කාලීන බදු දෙන දේපල 45 කින් 2024 දෙසැම්බර් 31 දිනට වාරික 10ට වැඩි හිඟ හිටි රු.4,071,724 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට කඩ 290කින් අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම රු.6,854,837ක් විය .මාස 10ට වැඩි හිඟ ශේෂ ඇති කඩකාමර 75කින් අයවිය යුතු හිඟ මුදල රු.5,564,827ක් විය.	මධ්‍යම වෙළඳපල අධිකරණ ක්‍රියාමාර්ගයට අදාළ කඩ කාමර 16ක හිඟ මුදල වන රු.2,248,433ක් අධිකරණ ක්‍රියාමාර්ගය අවසන් වන තුරු අයකරගැනීමට නිත්‍යානුකූලව කටයුතු කළ නොහැකි අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2024 ජනවාරි 01 දිනට මධ්‍යම වෙළඳපල කඩ කාමර හිඟ කුලිය රු.2,299,340ක් හා	මධ්‍යමවෙළඳපොලරු.100,000වැඩි හිඟ දේපලඅතරින් රු.705,660ක්	හිඟ කඩකුළි ආදායම්කඩිනමින්

	දිගරොල්ල දිනපොළ වෙළඳ සංකීර්ණයේ හිඟ කඩ කුලිය රු.1,748,344ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි.	සඳහා නඩු පවරා ඇති අතරරු.340,000 ක හිඟයක් වැරදි බිල් කිරීමක් වන බවත් 2023 වර්ෂයේ ජනවාරි මාසයේ මුද්‍රා තබා ඇති කඩ කාමර 02 සඳහා 2023 වර්ෂයට බිල් කර ඇති බවත්,වැඩිපුර බිල් කර ඇති රු.110,000 ක මුදල 2024වර්ෂයේ අවසන් ගිණුමෙන් ඉවත් කිරීමට අනුමත වී ඇති බව.	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	සභාව සතු කඩ කාමර අතරින් 2024 ජනවාරි 01 දිනට කඩ කාමරවලින් ඉවත්කිරීම්, මුද්‍රා තැබීම්, කඩ කාමර ගරා වැටීම් සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් භාවිතයට නොගෙන වසා දමා ඇති කඩ කාමර සංඛ්‍යාව 28 ක් වන අතර, අයකරගත නොහැකි වී ඇති හිඟකුලී මුදල රු.786,903ක් විය.	කඩ කාමර 03 ක් සඳහා බදුකරුවන් තෝරාගෙන ඇති බවත්කඩ කාමර තුනක් සභා තීරණය පරිදි යළි බදු නොදී ඒවා කඩා ඉවත් කිරීමටත්,මුද්‍රා තබා තිබූ කඩ කාමරයක් බදු පදනම මත ලබා දී ඇති බවත් කඩ කාමරයක් සඳහා ටෙන්ඩර් කැඳවූ සෑම අවස්ථාවකම කිසිදු ලංසුකරුවෙකු ඉදිරිපත් නොවුණ බවත්,අනෙකුත් කඩ කාමර මුද්‍රා තබා ඇති බව සහ අළුත්වැඩියා කටයුතු සඳහා නාගරික ඉංජිනේරු වෙත යොමු කර ඇති බව.	විධිමත් ලෙස කඩ කාමර භාවිතයට යොමුකර හිඟ ආදායම්කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(උ)	නගර සභාව විසින් බදු දෙනු ලබන දිගරොල්ල දිනපොළ කඩ කාමර 52 සඳහා 2024 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී එකතුව රු.1,329,255ක් වූ අතර, ගිවිසුම් කාලය ඉක්මවූ කඩ කාමරවල ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.එලෙසම එහි ඉහළ මාලයේ කඩ කාමර සියල්ල වසා දමා තිබුණි.	ගිවිසුම් කාලය ඉකුත් වී ඇති කඩ කාමරවල ගිවිසුම් යාවත්කාලීනකිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	ගිවිසුම්වලට එළඹීමටත් , හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ඌ)	දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු කඩ කුලි ආදායම් ශේෂ 06කඑකතුවවූ රු.7,828,293ක්අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි .	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ කඩකුළි ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2.3 අධිභාර

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.11,847,678ක් අයකර ගැනීමට තිබුණි.	මේ වනවිට නිලධාරීන් හය දෙනෙකු නිදහස් කර ඇති බවත්අට දෙනෙකු මියගොස් ඇති බවත් ඉතිරි 22 දෙදෙනෙකු වෙතින් කිසිඳු අධිභාරකරුවෙකු අධිභාරගත මුදල් ගෙවීමට එකඟතාව පලකර නොමැති බවත් අධිකරණ කටයුතු මගින් අයකර ගැනීම සඳහා පියවර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වරිපනම් අංශයේ පරිඝණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් පොදු මුරපදය භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10ක දී මාණ්ඩලික නිලධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදයද ව්‍යාජ ලෙස භාවිතා කර රු.105,893ක් වටිනා බිල්පත් අවලංගුකර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලාභය අයකර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 4/2018 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව	පිළිතුරු ලබා දී නොමැත.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් මහා නගර සභාව විසින් 2024 වර්ෂයේදී ද ස්ථාවරවත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.		
(ආ)	මන්ත්‍රීවරයකුගෙන් අයවිය යුතු හිඟ ඉන්ධන ශේෂය වූ රු.75,000ක් සමාලෝචිත වර්ෂය තුළ ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	අධිකරණය විසින් දැනුම් දී තිබූ කාලය තව දුරටත් දීර්ඝ කරවා ගැනීමට මහර රෙජිස්ට්‍රාර් විසින් අයැද තිබීම හේතුවෙන් ඊට ඉඩ ලබා දෙමින් 2025.12.17 දින දක්වා ඒ සඳහා කල් ලබා දී ඇති බව.	අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2019 සිට 2024 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රු29,433,064.ක වැටුප් ප්‍රතිපූර්ණය කරගැනීමට නොහැකි වී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	වැටුප් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සභාව සතුව තිබුණු කම්පැක්ටර් රථයකට 1999 අගෝස්තු 10 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවයට රු.3,001,717ක් ගෙවීමට අනතුරට වැරදිකරු වූ සභාවේ රියදුරුට නියම වී තිබූ අතරඑම මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි. 2019 පෙබරවාරි 28 දින වන විට රියදුරාගෙන් රු.112,205ක් පමණක් අයකරගෙන තිබුණු අතර 2021 මැයි 18 දිනැති සභා තීරණයක් මගින් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ 2:1, 2:2 වගන්තිවලට පටහැනිව 2019 මාර්තු මස සිට රියදුරාගෙන් අයකිරීම නතර කර තිබුණි. ඒ අනුව සභාවට අයවිය යුතු රු.2,889,512ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2023 වර්ෂය සඳහා වූ විදුලි බිල්පත් සම්බන්ධයෙන් අධිභාර ලෙස රු.70,653ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණු අතර, විදුලි බිල්පත් ගෙවීමට ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බිල්පත් භාර දීමට අදාල ස්ථානවල කිසිවකු නොමැති නිසා නැවත ලංකා විදුලි පුද්ගලික සමාගමේ ප්‍රධාන කාර්යාලයට භාර දෙන ලද විදුලි බිල්පත් තැපැල් මගින් එවීමේදී ප්‍රමාදවීමෙන් විදුලි	වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

		බිල්පත් ගෙවීමේ සහන කාලය පසුවීම නිසා ප්‍රමාද වී ගෙවීමට සිදුවූ බව.	
(ඊ)	2022 මාර්තු 18දින සභාව වෙත ලැබී තිබුණු රථයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාවට පවරාගෙන නොතිබූ අතර2006මාර්තු 22 දින සභාව වෙත ලැබී තිබුණු ගිනි නිවන රථයක්2024 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	පවරා ගැනීමට හා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	ලුනාව තානායම පිහිටා තිබූ සභාව සතු හෙක්ටයාර් 0.7063ක් විශාල ඉඩම රජයේ ඉඩම්ආඥා පනතේ (අධිකාරය 454) 06 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කිසිදු ගෙවීමකින් තොරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත 2021 දෙසැම්බර් 06 වැනි දින පවරා තිබුණි. ඒ අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් එහි මහල් නිවාස සංකීර්ණයක් ඉදිකර තිබුණු අතර, මේ වන විට එම නිවාස මහජනතාව වෙත අළෙවිකර තිබුණද නගර සීමාව තුළ ඇති නිවාස 175 සඳහා වරිපනම් තක්සේරු කර අංක ලබා දී වරිපනම් අයකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් නගර සභාවෙන් සපයා නොමැති අතර, සභාවට ලැබිය යුතු විශාල වරිපනම් ආදායමක් ද අහිමි වී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	වරිපනම් අයකිරීමට කටයුතු කර නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් සැපයිය යුතුය.
(ඌ)	පුද්ගලික ආයතනයකින් මිලදීගෙන 2022 ජුනි 03 දින ගබඩාවට ලැබී තිබූ ටී ෂර්ට් 864 ක් අතරින් 2024 දෙසැම්බර් 27 දින ගබඩා බින් කාඩ්පතේ ශේෂය අනුව ටී ෂර්ට් 159 ක් ඉතිරිව පැවතුණ ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ එම ටී ෂර්ට් ශේෂය දක්වා නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහල් 3 කින් හා කඩ කාමර 89කින් සමන්විත සභාවට අයත් මධ්‍යම වෙළඳපල පහළ මාලය	අබලන්ව ඇති මෙම ගොඩනැගිල්ල ඉවත් කර	අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය.

	වැසි දිනවලට ජලයෙන් පිරෙන බව නිරීක්ෂණය විය. තවද, පහළ මාලයේ ඇති වැසිකිලි ඉතාමත් අබලන් තත්වයේ පැවති අතර, එම වැසිකිලි දොරවල් සහ ජනෙල් කවුළුද නොමැතිව අනාරක්ෂිතව පැවතුණි. මෙහි පහළ මාලයේ ඇති බෞද්ධ කාන්තා සමිතිය සහ මොරටුව රජයේ විශ්‍රාමිකයන්ගේ සමිතියට අයත් කඩ කාමර 02 ක් දීර්ඝ කාලීනව වසා දමා ඇති බැවින් හා තෙවන මහලයේ ඇති ශාලාව සම්පූර්ණයෙන් වසා දමා ඇති බැවින් සභාවට අයකර ගැනීමට හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. තවද එහි ස්ලැබ් එක මත එකතු වන ජලය පහළට බැස යාමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් යොදා නොමැති බැවින් එහි වතුර පිරී ජලය පහළට කාන්දු වීමක්ද නිරීක්ෂණය විය.	නව ගොඩනැගිල්ලක් ස්ථාපනය කිරීමට යෝජිත බව.	
(ආ)	සභාව විසින් බදු පදනම මත ලබා දී තිබූ මධ්‍යම වෙළඳපල කඩ කාමර 06 ක් සඳහා සභාව විසින් ගෙවා තිබූ රු.69,959ක විදුලි බිල්පත් වටිනාකම නැවත කඩ හිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මෙම මුදල පැරණි බදුකරුවන් ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව	බදුකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 වර්ෂයේ ආරම්භ කරන ලද ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ විශේෂ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිචක්‍රිකරණ ද්‍රව්‍ය අයිතම 36ක් වෙනුවෙන් තොග රැස්කිරීමට කටයුතු කර තිබුණද, අයිතම 12 ක් පමණක් විකුණුම් කර තිබූ අතර ටින්, තහඩු, යකඩ, ඇලුමිනියම්, තඹ, ප්ලාස්ටික්, පොල්කටු, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හා බියර් කෑන්යන ද්‍රව්‍ය අලෙවියෙන් ලැබෙන මුදල් සේවක සුභ සාධනය සඳහා යොදවන බව ප්‍රකාශ කළ නමුත් ඒ සම්බන්ධයෙන් සභා තීරණයක් විගණනයට ඉදිරිපත් නොවිය. තවද, 2024 වර්ෂයේ බේල් අංගනයේ ඝණ අපද්‍රව්‍ය අලෙවියෙන් ලද ආදායම සභාවේ අරමුදලට යෙදූ බව හෝ එම ආදායමෙන් සුභ සාධන කටයුතු සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය මෙන්ම එම මුදල් වෙන්කිරීමේ පදනම හෝ තහවුරු නොවුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ඝණ අපද්‍රව්‍ය විධිමත්ව කළමණාකරණය කළ යුතුය.

3.5 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 12ක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සුදුසු පරිදි වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ලක්ෂපතිය ප්‍රදේශයේ ළමා හා මාතෘ සායන ගොඩනැගිල්ලේ උඩුමහල නිෂ්කාර්යව පැවති අතර, ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සභාව සතු වත්කම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ද සොයිසා සිහිති උයන තුළ ඉදිකර ඇති ක්‍රීඩා උපකරණ මෙන්ම වාඩිවීම සඳහා සකස් කරන ලද බංකු ආදීය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර, වල් බිහි වී උපකරණ දිරාපත් වෙමින් පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සිහිති උයන ප්‍රදේශවාසීන්ගේ භාවිතය සඳහා සුදුසු පරිදි නඩත්තු කළ යුතුය.
(ඈ)	2002 වර්ෂයේදි ඉදිකරන ලද උතුරු මොරටුමුල්ල සිරි සාසනවංශ අනුස්මරණ පුස්තකාලය හා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සහිත දෙමහල් ගොඩනැගිල්ල දිර්ඝ කාලයක සිට ප්‍රයෝජනය ගෙන නොතිබූ අතර, එය දිරාපත් වෙමින් පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අදාළ ගොඩනැගිල්ල ඵලදායි කාර්යයන් සඳහා යොදා ගත යුතුය.
(ඉ)	ඩික්සන් ජේ පීරිස් ක්‍රිඩාංගණයේ ක්‍රීඩාමණ්ඩප ගොඩනැගිල්ල අබලන්ව පැවති අතර ,එයට යාබදව ඉදිකර ඇති ළමාඋද්‍යානය නිශ්කාර්යව පැවතිණි.	පිළිතුරු ලබා දී නොමැත.	ක්‍රීඩාමණ්ඩප ගොඩනැගිල්ල හා ළමා උද්‍යානය විධිමත්ව නඩත්තු කළ යුතුය.
(ඊ)	ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රිඩාංගණයේ පැරණි ක්‍රීඩා මණ්ඩප ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයේ පැවති අතර ,නව ක්‍රිඩා මණ්ඩප ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අදාළ වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(උ)	විල්ලෝරාවත්ත ක්‍රිඩා මණ්ඩප ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවති අතර ,එහි අබලි ද්‍රව්‍ය ගොඩගසා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අදාළ වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	අඟුලාන ආදාහනාගාරයේ ආදාහන යන්ත්‍රය වසර ගණනාවක සිට භාවිතා කළ නොහැකි මට්ටමේ පැවති අතර, අළුත්වැඩියා කිරීමට ද කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සුදුසු පරිදි අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

(එ)	සොයිසා ක්‍රිඩාංගණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය වසර 04 ක පමණ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර, ගොඩනැගිල්ල දැඩි ලෙස අබලන්ව පැවතුණි. මේ හේතුවෙන් මංතීරු පුහුණුවීම් කටයුතු සඳහා යොදාගැනීමට නොහැකි වීමෙන් ප්‍රදේශයේ ජනතාවට ලබාදිය හැකිව තිබූ සේවය අහිමි වි ගොස් තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අලුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදීව සිදුකර ප්‍රදේශයේ ජනතාව වෙත සේවා සැපයීමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂය තුළදී සේවකයන් 140 දෙනෙකු නිත්‍ය තනතුරෙන් බැහැරව වෙනත් තනතුරුවල යොදවා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	නිත්‍ය තනතුරුවල රාජකාරි පැවරීමට කටයුතු කළ යුතුය.
(ii)	2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ස්ථිර පත්වීම් ලබාදුන් සේවකයන් 112 දෙනෙකු 2024 දෙසැම්බර් 31 දින වන විටත් සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මෙම සේවකයින් සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.57,537,369 ක් ගෙවා තිබුණි. මෙම සේවකයන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවිම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට ද නොහැකි වී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	වර්ෂ ගණනාවක සිට පැවත එන වරිපනම් බදු වංචා කිරීමෙන් සිදු වූ අලාභය වන රු.381,969ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. අලාභයෙන් රු.241,749ක් මෙම වරිපනම් බදු වංචාවට වගකිව යුතු නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ අයකර ගැනීමට 2011 පෙබරවාරි 14 දින විනය නියෝගයක් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන තුරු ද අය කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරුලබා දී නොමැත	අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	වැඩ තහනම් කළ දෙදෙනෙකුගෙන් රු.61,068ක් ද, සේවය හැරගිය නිලධාරින් 46 දෙනෙකුගෙන් රු.715,416ක් ද, විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරින් 24දෙනෙකුගෙන් රු.1,025,170 ක්ද වශයෙන් එකතුව	වැඩ තහනම් කළ නිලධාරින් හා සේවකයින් **දෙදෙනෙකුගේ** ණය ශේෂයන් විශ්‍රාම වැටුපෙන් හා ඇපකරුගෙන් අයකර	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	රු.1,801,654ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි.	ගැනීමට කටයුතු කරන බවත් සේවය හැර ගිය සේවකයින් 30 දෙනෙකුගේ ණය ශේෂයන් හා මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 15 දෙනකුගේ ණය ශේෂයන් කපා හැරීමට අනුමැතිය ලැබී ඇති බවත් අනෙකුත් ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව.	
(v)	අක්‍රිය ණය ශේෂ ලේඛණයේ ඇතුළත් නිලධාරින් 103 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.1,505,505ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂයන් කපා හැරීමට අනුමැතිය ලැබී ඇති බැවින් 2025 වර්ෂයේ අවසන් ගිණුම් මගින් නිරවුල් කරන බව.	හිඟ ණය ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.
(vi)	2022 හා 2023 වර්ෂයන්හි සේවය හැරගොස් ඇති සේවකයන් 08 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු ලෙස රු. 162, 725 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතු මුළු වටිනාකම රු.1,465,979 ක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.7 **වාහන පද්ධතියකළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු වාහන 24 ක් 2024 වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මහා නගර සභාවට අයත් වාහන රියදුරන් වෙත භාර දීමේදී ලිඛිත පැවරීමක් සිදු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	වාහන රියදුරන් වෙත භාර දීමේදී ලිඛිතව භාර දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 වර්ෂයේදි සිදු වූ වාහන අනතුර සම්බන්ධයෙන් අදාළ රක්ෂණ වන්දි මුදල් 2024 දෙසැම්බර් 31 වන විටත් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අදාළ රක්ෂණ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සභාව විසින් පරිහරණය කරනු ලබන රජ වාහන 08 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	2022 වර්ෂයේදී බාහිර ගරාජයකට යොමුකර තිබූ ට්‍රැක්ටර් රථ 02 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරගත යුතුය.
(ඊ)	2024 වර්ෂයේදී අපහරණය කරන ලද ගලි රථයට හා යතුරු පැදියට අදාල තොරතුරු ස්ථාවර වත්කම් ලේඛණයේ "ඩී" කොටසේ ඇතුලත් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අපහරණයට අදාල තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් මහ නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 08 ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2025 අප්‍රේල් 10 දින දීය.	පිළිතුරු ලබා දී නොමැත.	නියමිත දිනට හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මොරටුව මහා නගර සභාවේ 2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ව්‍යාපෘති 103 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 31 ක් පමණි.	පිළිතුරු ලබා දී නොමැත.	අයවැයගත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.3 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය සංකේත 11 ක අයවැය ගත ප්‍රතිපාදනය වූ රු.44,077,500කින් රු.27,743,701ක් උපයෝජනය කර නොතිබුණු අතර වැය සංකේත 05ක අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.3,496,218ක් වැයකර තිබුණි.	පාසල් උපකරණ/ පොත් මිලදී ගැනීම් අවශ්‍ය නොවීමත් , වෙළඳපල උච්චාවචන මත ඇස්තමේන්තු සිදුකිරීමත්, මාර්ග නඩත්තු සඳහා මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය ප්‍රමාණ අවම වීම යන	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.

		කරුණු අයවැයගත ප්‍රතිපාදන ඉතිරිකිරීම් වලට හේතු වූ බව.	
(ආ)	කිසිදු වියදමක් දරා නොතිබූ වැය ශිර්ෂයන් 11 ක් තුළ ඩෙංගු රෝග නිවාරණය සහ වසංගත රෝග වැලැක්වීම සඳහා වූවැය විෂයයන්ද නිරික්ෂණය විය.	සුසාන භූමි අළුත්වැඩියා භාක්‍රිඩාංගණ නඩත්තු සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීමත් මාණ්ඩලික නිලධාරි ඉන්ධන හා ප්‍රවාහනදීමනා ඉල්ලීමක්ඉදිරිපත් නොවීමත් වියදම් අසුරා තැබීම් භාඩෙංගු හා බෝවන රෝග වසංගත තත්ත්වයක් ඇති නොවීමත් ගිනිහට රක්ෂණාවරණඅවශ්‍යතාවය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබීමත්යන හේතුන් වියදම් නොදැරීමට හේතු වූ බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.
(ඇ)	වැය සංකේත 7 ක අතිකාල ගෙවීම් සඳහා වූ ප්‍රතිපාදන එකතුව රු.9,234,000ක් වූ අතර, ප්‍රතිපාදන ඉක්මවා රු.2,953,434ක් වැයකර තිබුණි.	වැය ශිර්ෂ 7 ක පමණක් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදල ඉක්මවා ගියත්,අතිකාල සඳහා වෙන්කළ මුළු ඇස්තමේන්තු මුදල තුළ සමස්ථ වියදම පියවා ගත හැකි බැවින් සේවා අවශ්‍යතාව මත එම වැය ශිර්ෂවල ඇස්තමේන්තුව ඉක්මවා අතිකාල ගෙවීම සිදු කරන ලද බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.
(ඈ)	සභාව විසින් නිල ඇඳුම් දීමනා සඳහා අයවැය ලේඛනය අනුව රු.9,339,000ක් ප්‍රතිපාදනය කර තිබුණද සත්‍ය නිල ඇඳුම් වියදම රු.2,300,191ක් වූයෙන් සියයට 75 ක් එනම් රු.7,038,809 ක අධි ඇස්තමේන්තුවක් සිදු කර තිබුණි.	2024 වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය 80%කට සීමා කිරීමත් කළමනාකරණ කමිටු වාර්තාව අනුව එක් නිල ඇඳුම් කට්ටලයක් ලබා දීමට නිර්දේශය ලබා දී ඇති බවත්, ඇඳුම් පැළඳුම් හා සපත්තුවල මිල නිරන්තරයෙන් ඉහළ යන බැවින් ඇස්තමේන්තුව සිදු කිරීමේදි එම අවිනිශ්චිතතා මත ප්‍රතිපාදන වෙන් කර ඇති බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.

4.4 තිරසර සංවර්ධනඅරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 සිට 2023 දක්වා වූ කාල පරිච්ජේදය සඳහා පමණක් තිරසර සංවර්ධන සැලැස්මක් සකස්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	තිරසාර සංවර්ධන ඉලක්ක ළගා කර ගැනීම සඳහා සැලැස්මක් පිළියෙල කළ යුතුය.